# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය
## (සංශෝධන)

**1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

ක්‍රීඩා අමාත්‍යතුමා විසින් 2017 ජූනි මස 21 වන දින
ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 මැයි මස 22 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[186 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 005272—510 (2017/06)

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින්, (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1999 අංක 17 දරන සුගතදස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය පනතේ දීර්ඝ නාමය සංශෝධනය කරනු ලබන අතර, එමගින් (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සුගතදස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරියේ බලතලවල විෂය පථය පුළුල් කරනු ලැබේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියට 2අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එමගින් අධිකාරියේ අරමුණු නිශ්චිතව දක්වනු ලැබේ.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එමගින් අධිකාරියට ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු පත් කිරීමට විධිවිධාන සලස්වනු ලැබේ.

***5 වන වගන්තිය*** : මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එමගින් අධිකාරියේ කර්තව්‍ය පුළුල් කරනු ලැබේ.

***6 වන වගන්තිය*** : මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එමගින් අධිකාරියට ස්වකීය අරමුණු ළඟා කර ගැනීමට බලතල ලබා දෙනු ලැබේ.

***7 වන වගන්තිය*** : මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, එය 4 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

## සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය (සංශෝධන)

එල්.ඩී.—ඕ 62/2016

**1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2017 අංක   දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1999 අංක 17 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය පනතේ දීර්ඝ නාමය, එහි සඳහන් "කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම සඳහා ද" යන වචන වෙනුවට "කළමනාකරණය කිරීම, නඩත්තු කිරීම, සුරැකීම සහ සංවර්ධනය කිරීම සඳහා ද" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 2අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 2අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"අධිකාරියේ අරමුණු.

2අ. අධිකාරියේ අරමුණු පහත දැක්වෙන පරිදි විය යුතු ය:—

(අ) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය කළමනාකරණය කිරීම, නඩත්තු කිරීම, සුරැකීම සහ සංවර්ධනය කිරීම;

(ආ) ක්‍රීඩා ආර්ථිකයේ සහ ක්‍රීඩා සංචාරක ව්‍යාපාරයේ අවශ්‍යතා සපුරාලීමට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ ක්‍රීඩා හා විනෝදාත්මක කටයුතු හා පහසුකම් වැඩි දියුණු කිරීම ;

(ඇ) රටෙහි ක්‍රීඩා අභිවෘද්ධිය වෙනුවෙන් සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ පවතින පහසුකම් සැපයීම;

(ඈ) සමාජ ඒකාබද්ධතාවට හා ජාතිය ගොඩනැගීමට උපකාරී වන ක්‍රමවේද ලෙස ක්‍රීඩා හා විනෝදාත්මක කටයුතු යොදා ගනු ලැබීම සහතික කිරීම ; සහ

2—PL 005172 -475 (2017/04)

(ඉ) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කොන්දේසි හා ගාස්තුවලට යටත් ව සුගතදස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ පහසුකම් ක්‍රීඩා, අධ්‍යාපනික, සංස්කෘතික හා විනෝදාත්මක කටයුතු සඳහා ලබාදීම.”.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්ති ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

“(3) අමාත්‍යවරයා විසින් —

(අ) මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු අධිකාරියේ සභාපතිවරයා ලෙස ; සහ

(ආ) අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම හා පරිපාලනය කිරීම පහසු කරනු පිණිස මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු අධිකාරියේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා ලෙස,

පත් කරනු ලැබිය යුතු ය.

(4) සභාපතිවරයාගේ, ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාගේ සහ මණ්ඩලයේ පත් කළ සාමාජිකයන්ගේ ධුර කාලය, සභාපතිවරයා, ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා සහ මණ්ඩලයේ පත් කළ සාමාජිකයන් විසින් ධුර හිස්කිරීම, මණ්ඩලයේ රැස්වීම් සහ අධිකාරියේ මුද්‍රාව සම්බන්ධයෙන් මේ පනතේ උපලේඛනයේ විධිවිධාන අදාළ වන්නේ ය.”.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (අ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

“(අ) සුගතදස ජාතික ක්‍රීඩා සංකීර්ණය කළමනාකරණය කිරීම, නඩත්තු කිරීම, සුරැකීම හා සංවර්ධනය කිරීම සහ ජාතික වත්කමක් ලෙස එය ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනීම; ”; සහ

(2) එහි (ඟ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඟ) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කොන්දේසිවලට සහ ප්‍රමාණවත්, පිරිවැය ආවරණය වන ගාස්තුවලට යටත් ව සුගතදස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ පහසුකම්, ක්‍රීඩා, අධ්‍යාපනික, සංස්කෘතික හා විනෝදාත්මක කටයුතු සඳහා ලබාදීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (අ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) චංචල හා නිශ්චල දේපළ මිල දී ගැනීමට හා දැරීමට සහ එම දේපළ බදු දීමට හෝ කුලියට දීමට; "; සහ

(2) එම වගන්තියේ (ඒ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඒ) මේ පනත යටතේ අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා හෝ අධිකාරියේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය වන, ආනුෂංගික වන හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියා කිරීමට.".

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි 6 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :—

"6. රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා, තම ධුරයේ කාර්ය ඉටුකිරීමට මණ්ඩලයේ සභාපතිවරයාට, ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාට හෝ යම් පත් කළ සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් 3 වන වගන්තියේ විධිවිධාන

සැලකිල්ලට ගනිමින්, අවස්ථාවෝචිත පරිදි, ඒ සභාපතිවරයා, ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා හෝ ඒ පත් කළ සාමාජිකයා වශයෙන් කටයුතු කිරීමට වෙනත් නිල බලයෙන් පත්වන සාමාජිකයකු හෝ පත් කළ සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.";

(2) එහි 8 වන අයිතමයෙහි "සභාපතිවරයා ධුරයෙන්" යන වචන වෙනුවට "සභාපතිවරයා හෝ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා ධුරයෙන්" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එහි 9 වන අයිතමයෙහි "සභාපතිවරයාට තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය." යන වචන වෙනුවට "සභාපතිවරයාට හෝ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාට පිළිවෙළින් සභාපති ධුරයෙන් හෝ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) එහි 10 වන අයිතමයෙහි "සභාපතිවරයාගේ ධුර කාලය" යන වචන වෙනුවට "සභාපතිවරයාගේ හෝ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාගේ ධුර කාලය" යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**8.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.